සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

61 S I

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය : .............................................. භූගෝල විද්‍යාව - I කාලය : පැය 03 යි.

✳ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විත ය.

✳ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

✳ **ප්‍රශ්න අංක 01 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

(01) ශාක පත්‍ර මගින් ජලය ............................................................. වීමෙන් වායුගෝලයට එක්වෙයි.
(වාෂ්පීකරණය / වර්ෂණය / උත්ස්වේදනය)

(02) පෘථිවි කබොල හා ............................................................. ඇතුළත් කලාපය ශිලාගෝලය ලෙස හැඳින්වෙයි.
(ප්‍රාවරණය / ඉහළ ප්‍රාවරණය / පහළ ප්‍රාවරණය)

(03) මහද්වීපික මායිමේ සිට සාගරය දෙසට පැතිරී ගිය නොගැඹුරු මුහුදු තීරය ............................................................. නමින් හැඳින්වේ. (මහද්වීපික මායිම / මහද්වීපික බෑවුම / මහද්වීපික තටකය)

(04) පෘථිවි ගෝලයේ උතුරු අක්ෂාංශ 23 1/2$^0$ සිට දකුණු අක්ෂාංශ 23 1/2$^0$ දක්වා ව්‍යාප්ත වී ඇත්තේ ............................................................. දේශගුණ කලාපයයි.
(නිවර්තන / සෞම්‍ය / ශීත)

(05) ලෝකයේ රබර් වගා කරන ප්‍රධාන රටක් වන ............................................................. ආසියා මහද්වීපයට අයත් රටකි.
(මැඩගස්කරය / ඉන්දුනීසියාව / ඊජිප්තුව)

(06) ශ්‍රී ලංකාවේ මැද රට තේ වගාව දක්නට ලැබෙන්නේ මාතලේ, මහනුවර හා ................................................ යන දිස්ත්‍රික්කවල ය. (නුවරඑළිය / රත්නපුරය / බදුල්ල)

(07) මුල් අවධියේ දී යකඩ හා වානේ සඳහා ඉහළ ඉල්ලුමක් පැවතිය ද පසු කාලීනව ............................................................. සොයා ගැනීමත් සමඟ ඒ සඳහා පැවති ඉල්ලුම අඩු විය.
(ප්ලාස්ටික් / ඇලුමිනියම් / තඹ)

(08) පෙට්‍රෝ රසායන කර්මාන්තය පවතින්නේ ............................................................. යන ප්‍රධාන අමුද්‍රව්‍ය මත ය.
(යපස් / ගල්අඟුරු / ඛනිජ තෙල්)

(09) පැළෑටි වර්ධනය වේගයෙන් සිදු වන හා ජෛව විවිධත්වය ඉහළ මට්ටමක පවතින්නේ ............................................................. වනාන්තරවල ය. (නිවර්තන වර්ෂා / සෞම්‍ය කලාපීය / කේතුධර)

(10) යාල, රිටිගල හා ............................................ ශ්‍රී ලංකාවේ පිහිටි දැඩි ස්වාභාවික රක්ෂිත වේ.
(සිංහරාජය / කුමන / හග්ගල)

✳ **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් 'නි' යන්න වටා ද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

(11) උතුරු හා දකුණු ධ්‍රැව ආසන්න ප්‍රදේශවල දක්නට ලැබෙන්නේ මධ්‍යධරණී දේශගුණයයි. ( නි /වැ )

(12) ශ්‍රී ලංකාවේ පහත රට තෙත් කලාපීය ප්‍රදේශවල බහුලව ව්‍යාප්ත වී ඇත්තේ රතු කහ පොඩ්සෝල් පසයි. ( නි /වැ )

(13) ශ්‍රී ලංකාවේ ජල විදුලිය වැඩි වශයෙන් යොදා ගන්නේ ප්‍රවාහන කටයුතු සඳහා ය. ( නි /වැ )

(14) පොස්පේට් හා හුණුගල්, ලෝහමය නොවන ඛනිජ ගණයට අයත් වෙයි. ( නි /වැ )

(15) ලෝකයේ මුළු ජනගහනයෙන් අඩකට වැඩි ප්‍රමාණයක් වාසය කරන්නේ අප්‍රිකා මහද්වීපයේ ය. ( නි /වැ )

✳ **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

(16) පෘථිවි අභ්‍යන්තරයේ අපාරගම්‍ය පාෂාණ ස්තර මත .................................... ජලය තැන්පත් වී ඇත.


(17) ලෝකයේ වාර්ෂික මිනිරන් නිෂ්පාදනයෙන් 60%ක් පමණ නිපදවන්නේ............................. යි.

(18) ශ්‍රමිකයන්ගෙන් විශාල පිරිසක් විද්‍යාඥයන්, ඉංජිනේරුවන්, පුහුණු කාර්මික ශිල්පීන් හා පර්යේෂකයන් වන්නේ .................................. කර්මාන්තය තුළයි.

(19) වික්ටෝරියා බලාගාරය ............................ ගංගාව හා සම්බන්ධ ජල විදුලි බලාගාරයකි.

(20) යම් ස්ථානයක පිහිටීම ප්‍රකාශ කිරීමේ දී අක්ෂාංශ හා දේශාංශ මගින් නිවැරදිව දැක්වීම ........................... පිහිටීම ලෙස හඳුන්වයි.

✳ **ප්‍රශ්න අංක 21 සිට 24 දක්වා පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ශ්‍රී ලංකා සිතියම යොදන්න.**





(21) ශ්‍රී ලංකාවේ බෝට්ටු නිෂ්පාදනය කරන බේරුවල දැක්වෙන්නේ .................................... අක්ෂරයෙනි.

(22) වීදුරු නිෂ්පාදනයට අවශ්‍ය සිලිකා වැලි නිධියක් පිහිටි නාත්තන්ඩිය ප්‍රදේශය ............................. අක්ෂරයෙන් දැක්වේ.

(23) ශ්‍රී ලංකාවේ සුළං විදුලි බලාගාරයක් පිහිටි ප්‍රදේශය දැක්වෙන්නේ................................. අක්ෂරයෙනි.

(24) මහ ඉලුප්පල්ලම වී පර්යේෂණ ආයතනය පිහිටි ස්ථානය .......................... අක්ෂරයෙන් දැක්වේ.

✳ **ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම් පිළිබඳ සටහනක් මෙහි දක්වා ඇත.**
**ප්‍රශ්න අංක 25 සිට 26 දක්වා පිළිතුරු සැපයීම සඳහා එය භාවිතා කරන්න.**



**ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම් - 2012**

(25) ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟළුම් අපනයනය කිරීම අයත් වන්නේ .................................... අක්ෂරයෙන් දැක්වෙන කොටසට ය.

(26) තේ, රබර්, එළවළු, පලතුරු යනාදිය අපනයනය කිරීම අයත් වන්නේ ............................. අක්ෂරයෙන් දැක්වෙන කොටසටය.

✳ **ප්‍රශ්න අංක 27 සිට 30 දක්වා ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවා සම්බන්ධතාව අනුව ගැළපූ විට නිවැරදි පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියා දක්වන්න.**

(27) ලෝකයේ පිහිටි භූ ලක්ෂණ කිහිපයක නම් 'අ' තීරුවේ ද ඒවා පිහිටි මහාද්වීප 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙළට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| **භූ ලක්ෂණ** | **අයත් මහද්වීප** |
| 1. ඇපිනයින් කඳු | A. ඕස්ට්‍රේලියා මහද්වීපය |
| 2. බියෙ සානුව | B. යුරෝපා මහද්වීපය |
| 3. බයිකල් විල | C. අප්‍රිකා මහද්වීපය |
| | D. ආසියා මහද්වීපය |

(1) A, C, B (2) B, C, D (3) C, D, B (4) D, A, B (............)

(28) ශ්‍රී ලංකාවේ පිහිටි වනාන්තර වර්ග කිහිපයක් 'අ' තීරුවේ ද ඒවා පිහිටි ප්‍රදේශ කිහිපයක් 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙළට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| **වනාන්තර වර්ග** | **පිහිටි ප්‍රදේශ** |
| 1. නිවර්තන තෙත් වනාන්තර | A. පිදුරුතලාගල, හෝටන් තැන්න |
| 2. කඳුකර තෙත් වනාන්තර | B. අඹේවෙල, සීතාඑළිය |
| 3. කඳුකර වියළි කලාපීය වනාන්තර | C. සඳතැන්න, කඳපොල |
| | D. දෙදියගල, කන්නෙලිය |

(1) D,A, B (2) B, C,A (3) C, D, B (4) B, A, C (............)

(29) ස්වාභාවික සම්පත් වර්ග කිහිපයක් 'අ' තීරුවේ ද ඒවාට නිදසුන් කිහිපයක් 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙළට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| **ස්වභාවික සම්පත් වර්ග** | **නිදසුන්** |
| 1. ක්ෂය වන සම්පත් | A. ගල් අඟුරු |
| 2. ක්ෂය නොවන සම්පත් | B. පස |
| 3. පුනර්ජනනීය සම්පත් | C. ජලය |
| | D. වනජීවීන් |

(1) B,C, A (2) C, D, B (3) A, C, B (4) A, D, C (............)

(30) ශ්‍රී ලංකාවේ වගා කරන බෝග වර්ග කිහිපයක් 'අ' තීරුවේ ද ඒවා වගා කරන ප්‍රදේශ කිහිපයක් 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' තීරුවේ අනුපිළිවෙළට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| **භෝග වර්ග** | **විශේෂ වගා ප්‍රදේශ** |
| 1. කජු | A. මාතලේ |
| 2. මිරිස් | B. කටුගම්පොල |
| 3. බුලත් | C. දඹදෙණිය |
| | D. රාජාංගනය |

(1) D, B, A (2) A, D, C (3) B, C, A (4) C, D, B (............)

✳ **ප්‍රශ්න අංක 31 සිට 39 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

(31) ලෝකයේ විශාලතම විල පිහිටා ඇති මහද්වීපය කුමක් ද?
(1) උතුරු ඇමෙරිකා මහද්වීපය (2) දකුණු ඇමෙරිකා මහද්වීපය
(3) අප්‍රිකා මහද්වීපය (4) ආසියා මහද්වීපය (............)

(32) ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික නොවන සුළු අපනයන බෝග වර්ග දැක්වෙන වරණය තෝරන්න.
(1) තේ, පොල් (2) රබර්, ගම්මිරිස්
(3) කුරුඳු, කෝපි (4) මල්, පලතුරු (............)

(33) ලෝකයේ යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන වන පිට්ස්බර්ග්, ඩෙට්රොයිට් යන කලාප පිහිටා ඇත්තේ
(1) ජපානයේ ය. (2) රුසියාවේ ය.
(3) එක්සත් රාජධානියේ ය. (4) ඇමෙරිකා එක්සත් ජනපදයේ ය. (............)

(34) පෘථිවියෙහි ඇති ජල ප්‍රමාණයෙන් මිරිදිය ජලය ලෙස පවතින්නේ මින් කවර ප්‍රමාණයක් ද?
(1) 1% කි. (2) 2% කි.
(3) 3% කි. (4) 20% කි. (............)

(35) 1: 50,000 භූ ලක්ෂණ සිතියමකින් නිරූපණය වන සැබෑ භූමියේ වර්ග ප්‍රමාණය කොපමණ ද?
(1) 50,000 $km^2$ (2) 10,000 $km^2$
(3) 1,000 $km^2$ (4) 5,000 $km^2$ (............)

(36) වර්තමානයේ ශ්‍රී ලංකාවේ වැව් හා ජලාශවල බෝ කරනු ලබන මිරිදිය මත්ස්‍ය වර්ග වන්නේ,
(1) තිලාපියා හා ගුරාමියා ය. (2) කැට්ලා හා ලූලා ය.
(3) හුංගා හා තඹලයා ය. (4) ග්‍රාස්කාප් හා මගුරා ය. (............)

(37) පහත දැක්වෙන සිතියම් වර්ග අතුරින් තේමා සිතියමක් නොවන්නේ කවරක් ද?
(1) භූ ලක්ෂණ සිතියම (2) අප්‍රිකාවේ භූ විෂමතා සිතියම
(3) ආසියාවේ ජන ඝනත්ව සිතියම (4) ශ්‍රී ලංකාවේ මාර්ග සිතියම (............)

(38) ශ්‍රී ලංකාවේ ඇති මුළු ගංගා නිම්න සංඛ්‍යාව
(1) 80 කි. (2) 78 කි.
(3) 103 කි. (4) 110 කි. (............)

(39) ශ්‍රී ලංකාවේ දිග හා පළල ගණනය කිරීම සඳහා භාවිත කොට ඇති භූ ලක්ෂණය වන්නේ මින් කවරක් ද?
(1) වෙරළ බඩ තැනිතලා (2) කලපු හා බොකු
(3) ගංගා මෝය (4) මුහුදු තුඩු (............)

(40) පහත දැක්වෙන A, B, C, D වලින් දැක්වෙන මාතෘකා යුගල අතරින් පළමු වැන්නේ යහ පැවැත්මට දෙවැන්න අත්‍යවශ්‍ය වන සාධකය සහිත මාතෘකා යුගලය තෝරන්න.

A. - 1. රසායනික පොහොර භාවිතය
2. අම්ල වැසි

B. - 1. ෆොසිල ඉන්ධන භාවිතය
2. වායු දූෂණය

C. - 1. ජල මූලාශ්‍ර
2. වන රෝපණය

D. - 1. තිරසාර සංවර්ධනය
2. පාරිසරික සමතුලිතතාව

(1) A (2) B
(3) C (4) D (............)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

61 S II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය : ..............................................   භූගෝල විද්‍යාව - II

- ✳ මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකි.
- ✳ පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ✳ II කොටසින් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

### I කොටස

(01) (අ) ඔබ වෙත සපයා ඇති 1 : 50, 000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.

- අංක (i) සිට (iii) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) (A) - (B) රේඛාවෙන් දක්වා ඇති බෑවුම කුමක් ද? (ලකුණු 01)

(උත්තල බෑවුම / දළ බෑවුම / මද බෑවුම)

(ii) (C) අක්ෂරයෙන් දැක්වෙන වගාව කුමක් ද?

(ගෙවතු වගාව / වෙනත් වැවිලි / තණ බිම්) (ලකුණු 01)

(iii) ගඟ මත වැටී ඇති පරිපාලන මායිම කුමක් ද?

(නගර සභා සීමාව / පළාත් මායිම / දිස්ත්‍රික්ක මායිම) (ලකුණු 01)

(iv) (D) අක්ෂරයෙන් දැක්වෙන සංකේතය කුමක් ද? (ලකුණු 01)

(v) $A_2$ මාර්ගයේ X සිට Y දක්වා දිග කිලෝමීටර් කීය ද? (ලකුණු 01)

(vi) මුහුදු ප්‍රදේශයේ P අක්ෂරයෙන් දැක්වෙන රේඛාව කුමක් ද? (ලකුණු 01)

(vii) සිතියම් ප්‍රදේශයේ කඳුවැටිය මත ව්‍යාප්තව ඇති ස්වාභාවික වෘක්ෂලතා වර්ගයක් නම් කරන්න. (ලකුණු 01)

- සිතියම් ප්‍රදේශය පිළිබඳව පහත ප්‍රකාශ නිවැරදි නම් 'නි' යන්න ද වැරදි නම් 'වැ' යන්න ද ඉදිරියේ ලියා දක්වන්න.

(viii) දකුණු ප්‍රදේශයේ ඇති වැලිගම කලපුව වෙරළ බඩ භූ ලක්ෂණයකි. (   ) (ලකුණු 01)

(ix) රේඛීය ජනාවාස බහුලව පිහිටා ඇත්තේ $A_2$ මාර්ග ආශ්‍රිතව ය. (   ) (ලකුණු 01)

(x) සිතියම් ප්‍රදේශය දිස්ත්‍රික්ක දෙකකට අයත් වේ. (   ) (ලකුණු 01)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර එක් එක් ප්‍රශ්නවලට අදාළ නිවැරදි ඉංග්‍රීසි අක්ෂරය සිතියමෙන් තෝරා ඉදිරියේ ඇති කොටුව තුළ ලියන්න.

(i) අර්ධ වශයෙන් ගොඩබිමින් වට වූ කළු මුහුද දැක්වෙන අක්ෂරය A, B, C

(ii) ගල් අඟුරු නිධි පිහිටා ඇති ඇපලේචියන් කඳු වැටිය දැක්වෙන අක්ෂරය D, E, F

(iii) නැව් නිෂ්පාදනයේ පෙරමුණ ගත් දකුණු කොරියාව දැක්වෙන අක්ෂරය G, H, J

(iv) මිහිකත සමුළුව පැවැති රියෝද ජැනයිරෝ නගරය දැක්වෙන අක්ෂරය K, L, M

(v) කොංගෝ ගඟ දැක්වෙන අක්ෂරය P, Q, R (ලකුණු 05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි ඉංග්‍රීසි අක්ෂරය සිතියමෙන් තෝරා ඉදිරියේ ඇති කොටුව තුළ ලියන්න.

(i) පොල් පර්යේෂණ ආයතනය - ලුණුවිල - A, B, C

(ii) ජාතික උද්‍යානයක් වන - සෝමාවතිය - D, E, F

(iii) තාප විදුලි බලාගාරය - චුන්නාකම් - G, H, J

(iv) පුරාණ නගර කලාපයට අයත් - සීගිරිය K, L, M

(v) වලවේ ගඟ P, Q, R (ලකුණු 05)

## II කොටස

(02) පෘථිවි උප පද්ධතියට අයත් සුවිශේෂී උප පද්ධතියක් ලෙස වායුගෝලය හැඳින්විය හැකිය.

(i) වායුගෝලයේ වැඩි ම ප්‍රතිශතයක් ඇති වායු වර්ග දෙක පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) පතන ශීඝ්‍රතාවය ක්‍රියාත්මක වන වායු ස්ථරය කුමක් ද?

(b) වායුගෝලයේ උෂ්ණත්වය අඩු ම වායු ස්ථරය නම් කරන්න.

(c) වායුගෝලයට විවිධ දූෂක ද්‍රව්‍ය එක් වන ස්වාභාවික ක්‍රියාවලියක් ලියන්න. (ලකුණු 03)

(iii) වායු දූෂණයට හේතු වන මිනිස් ක්‍රියාකාරකම් තුනක් ලියා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) ස්වාභාවික සම්පත් අතර පාෂාණවලට හිමි වන්නේ වැදගත් ස්ථානයකි.

(ඩොලමයිට්, ජිප්සම්, ග්‍රැනයිට්, බැසෝල්ට්, ගැබ්රෝ)

(i) වරහන තුළ දක්වා ඇති පාෂාණ අතරින්,

(a) අවසාදිත පාෂාණ වර්ගයක් නම් කරන්න.

(b) විපරීත පාෂාණ වර්ගයක් නම් කරන්න. (ලකුණු 02)


(ii) (a) නිර්මාණය වන ස්ථානය අනුව ආග්නේය පාෂාණ වර්ග දෙක නම් කරන්න.

(b) ආගමික ස්ථානවල ඇති පියගැට පෙළ, ගල් කණු, සමාධි හා අවුකන ප්‍රතිමා නිර්මාණය සඳහා යොදා ගෙන ඇති විපරිත පාෂාණ වර්ගය කුමක් ද? (ලකුණු 03)

(iii) (a) පස පරිහරණය කිරීමේ දී මතු වී ඇති ගැටළු දෙකක් ලියන්න.

(b) පස සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියා මාර්ග දෙකක් සඳහන් කොට ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

- ප්‍රශ්න අංක 4, 5, 6 සඳහා පිළිතුරු සැපයීමට පහත ලෝක සිතියම භාවිතා කරන්න.




(04) අතීතයේ සිට වර්තමානය දක්වා ම විවිධ අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ස්වාභාවික සම්පතක් ලෙස වනාන්තර හඳුන්වා දිය හැකි ය.

(i) (a) A අක්ෂරයෙන් දැක්වෙන ප්‍රදේශයේ ව්‍යාප්තව ඇති වනාන්තර වර්ගය නම් කරන්න.

(b) C අක්ෂරයෙන් දැක්වෙන ප්‍රදේශයේ ව්‍යාප්තව ඇති වනාන්තරවල විශේෂ ලක්ෂණයක් ලියන්න.

(ලකුණු 02)

(ii) පරිසරය තුළ වනාන්තර පැවතීමේ වැදගත්කම කරුණු තුනකින් දක්වන්න. (ලකුණු 03)

(iii) (a) A අක්ෂරයෙන් දැක්වෙන වනාන්තර වර්තමානයේ සීඝ්‍රයෙන් විනාශ වෙමින් පවතී. ඊට බලපා ඇති හේතු දෙකක් ලියන්න.

(b) වනාන්තර ආරක්ෂා කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(05) ඈත අතීතයේ සිට ම මිනිසුන් ආහාර නිපදවා ගැනීම සඳහා කෘෂිකර්මාන්තයේ නිතර විය.

(i) (a) සිතියමේ E හා H අක්ෂරවලින් දක්වා ඇති තිරිඟු වගා කරන ප්‍රධාන රටවල් දෙකක් නම් කරන්න.

(ලකුණු 02)

(ii) තිරිඟු වගාව සඳහා අවශ්‍ය භෞතික සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) තිරිඟු වගාව හා වී වගාව ආශ්‍රිත වෙනස්කම් දෙකක් ලියන්න.

(b) වර්තමානයේ වී වගාවේ දී මතු වී ඇති ගැටළු දෙකක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(06) මිනිස් අවශ්‍යතා සපුරාලීම සඳහා ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත විශාල දායකත්වයක් ලබා දී තිබේ.

(i) ඉහත ලෝක සිතියමේ දක්වා ඇති කපු වගා කරන ප්‍රදේශ වන,

(a) ටෙක්සාස් ප්‍රදේශය දැක්වෙන අක්ෂරය නම් කරන්න.

(b) යැංසි ප්‍රදේශය දැක්වෙන අක්ෂරය නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) කපුපිළි කර්මාන්තය අනෙකුත් නිෂ්පාදන කර්මාන්තවලින් වෙනස් වන සාධකයක් සඳහන් කරන්න.


(b) නිවර්තන කලාපීය රටවලින් කපුරෙදි සඳහා ඉහළ ඉල්ලුමක් ඇතිවීමට හේතු දෙකක් ලියන්න.

(ලකුණු 03)

(iii) නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිතව මතු වී අති පාරිසරික ගැටළු තුනක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(07) ශ්‍රී ලංකාවේ නිශ්චිත භූමි ප්‍රදේශයකට ගොඩබිම පමණක් නොව සාගරයේ කොටසක් ද අයත් වේ.




(i) සිතියමේ B හා C ලෙස දක්වා ඇති කලාප දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) A අක්ෂරයෙන් දැක්වෙන කලාපය නම් කරන්න.

(b) එහි ඇති ශ්‍රී ලංකාවට අයත් සම්පත් මොනවා ද? (ලකුණු 03)

(iii) (a) ඓතිහාසික ජල ප්‍රදේශය යන්න පැහැදිලි කරන්න.

(b) දිවයින වටා ඇති සාගර සම්පතෙහි ඇති ආර්ථික වැදගත්කම කරුණු දෙකකින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(08) ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල ගෘහ කර්මාන්ත ව්‍යාප්ත වී ඇති අතර ඉන් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට යම් දායකත්වයක් ලැබී ඇත.


(i) ශ්‍රී ලංකාවේ ඇති ගෘහ කර්මාන්ත හතරක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ගෘහ කර්මාන්ත අංශයෙහි කැපී පෙනෙන ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) වර්තමානයේ ගෘහ කර්මාන්ත නගා සිටුවීමට ශ්‍රී ලංකා රජය ගෙන ඇති පියවර දෙකක් ලියන්න.


(b) එම කර්මාන්ත ආශ්‍රිතව වර්තමානයේ මතු වී ඇති ගැටළු දෙකක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ආ) / (ஆ) / (b)




(i)
(ii)
(iii)
(iv)
(v)

(ඉ) / (இ) / (c)




(i)
(ii)
(iii)
(iv)
(v)

(1) (අ) அ (a) $\frac{}{10}$ (ආ) (ஆ) (b) $\frac{}{5}$ (ඉ) (இ) (c) $\frac{}{5}$ = $\frac{}{20}$

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය : ........................................... භූගෝල විද්‍යාව - II

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. (For Examiner's Use Only)

(1) (අ) **(a)**

(i) ..........................................................................................................

(ii) ..........................................................................................................

(iii) ..........................................................................................................

(iv) ..........................................................................................................

(v) ..........................................................................................................

(vi) ..........................................................................................................

(vii) ..........................................................................................................

(viii) ..........................................................................................................

(ix) ..........................................................................................................

(x) ..........................................................................................................

/10


වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - **Provincial Department of Education - NWP**

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020 - **First Term Test - Grade 11 - 2020**

නම/විභාග අංකය : ..............................................

**GEOGRAPHY - II** භූගෝල විද්‍යාව - II **61 II**

# SRI LANKA 1:50,000 SHEET No. 91 - MATARA (PART OF)




Scale : 1 : 50 000

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

61 | S | I,II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 11 - 2020

## භූගෝල විද්‍යාව පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) - උත්ස්වේදනය | (11) - වැ | (21) - P | (31) - (1) |
| (2) - ඉහළ ප්‍රාවරණය | (12) - නි | (22) - B | (32) - (4) |
| (3) - මහද්වීපික තටකය | (13) - වැ | (23) - M | (33) - (4) |
| (4) - නිවර්තන | (14) - නි | (24) - H | (34) - (3) |
| (5) - ඉන්දුනීසියාව | (15) - වැ | (25) - A | (35) - (3) |
| (6) - බදුල්ල | (16) - භූගත | (26) - B | (36) - (1) |
| (7) - ඇලුමිනියම් | (17) - ඉන්දියාව | (27) - (2) | (37) - (1) |
| (8) - ඛනිජතෙල් | (18) - විද්‍යුත් | (28) - (1) | (38) - (3) |
| (9) - නිවර්තන වර්ෂා | (19) - මහවැලි | (29) - (3) | (39) - (4) |
| (10) - හග්ගල | (20) - නිරපේක්ෂ | (30) - (4) | (40) - (3) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් ලකුණු 40යි)

### II පත්‍රය

#### I කොටස

(01) (අ) (i) මද බැවුම

(ii) වෙනත් වැවිලි

(iii) නගර සභා සීමාව

(iv) අක්ෂාංශ දේශාංශ කැපී යන ස්ථානය

(v) 3km

(vi) සම ගැඹුරු රේඛාව

(vii) වනාන්තර, ලඳු කැළෑ

(viii) වැ

(ix) නි

(x) නි

(නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් ලකුණු 10යි)

(ආ) (i) B

(ii) D

(iii) J

(iv) K

(v) P

(නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් ලකුණු 5යි)

(ඉ) (i) A

(ii) F

(iii) G

(iv) M

(v) P

(නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් ලකුණු 5යි)

#### II කොටස

(02) (i) නයිට්‍රජන්, ඔක්සිජන් (ලකුණු 2)

(ii) (a) පරිවර්තීගෝලය

(b) මෙසෝගෝලය

(c) ගිනිකඳු පිපිරීම, වගුරුබිම් (ලකුණු 3)

(iii) වන විනාශය, ගිනිතැබීම්, කම්හල්වලින් විවිධ වායු වර්ග පිටවීම, ෆොසිල ඉන්ධන දහනය

(ලකුණු 5)

(කරුණු තුනට ලකුණු 03, විස්තර කිරීම ලකුණු 02)

(03) (i) (a) ජිප්සම්

(b) ඩොලමයිට් (ලකුණු 2)

(ii) (a) ආක්‍රාන්ත ආග්නේය පාෂාණ

නිෂ්ක්‍රාන්ත ආග්නේය පාෂාණ

(b) නයිස් (ලකුණු 3)

(iii) (a) අධික ලෙස ඛාදනය වීම, පසෙහි සරු බව අඩුවීම, පස ලවණීකරණය වීම, පසෙහි ජලය රඳවා ගත හැකි පාංශු ජීවීන් විනාශ වීම

(b) ආවරණ බෝග වැවීම, පසට සුදුසු බෝග තෝරා ගැනීම, ඓන්ද්‍රීය පොහොර භාවිතය වැඩි දියුණු කිරීම, ගල්වැටි දැමීම ..... ආදිය

(ලකුණු 3)

(04) (i) (a) A - නිවර්තන වර්ෂා වනාන්තර

(b) C - ගස් කේතුරූපාකාරය, ශාක කඳන් ඍජු ය, ඉදිකටු වැනි ශාක පත්‍ර ඇත. (ලකුණු 2)

(ii) ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම

භූගත ජල ගබඩාව ආරක්ෂා කිරීම

පිරිසිදු වායුගෝලයක් පවත්වා ගැනීමට

පාංශු ඛාදනය අවම කිරීමට

සුන්දර වටපිටාවක් නිර්මාණයට (ලකුණු 3)

(iii) (a) ජනාවාස තනා ගැනීමට වනාන්තර හෙළි කිරීම

වගා කිරීම හා සත්ත්ව පාලනය සඳහා වනාන්තර හෙළි කිරීම.

(b) වන වගාව දිරි ගැන්වීම

වන විනාශයේ අහිතකර ප්‍රතිඵල ජනතාව දැනුවත් කිරීම

පරිසර සංවේදී කලාප ඇති කිරීම

පවතින නීති බල ගැන්වීම. (ලකුණු 5)

(05) (i) E - රුසියාව H - පාකිස්ථානය (ලකුණු 2)

(ii) භූමිය - ජලය බැස යන තැනිතලා බිම

පස - චර්නෝසම් පස

වර්ෂාපතනය 300mm - 500mm

සිසිල් තෙත් දේශගුණය (ලකුණු 3)

(iii) (a) වී වගා බිම් කුඩාවීම - තිරිඟු වගා බිම් විශාල වීම

යන්ත්‍ර භාවිතය අඩුයි - මහා පරිමාණ යන්ත්‍ර භාවිතා වෙයි.

නිපදවන රටවල් පරිභෝජනය කරයි. - නිපදවන රටවල් අලෙවි කරයි.

(b) වියදම අධික වීම, අයහපත් කාලගුණය, වගා බිම් වෙනත් කටයුතු සඳහා යොදා ගැනීම, ගොවියන් ණය ගැතියන් වීම, තරුණ පරපුර වගාවෙන් ඈත්වීම.

(06) (i) (a) R

(b) K (ලකුණු 2)

(ii) (a) කෘෂිපාදක අමුද්‍රව්‍ය භාවිතය

පරිසර හිතකාමී වීම

ලාභදායික ශ්‍රමය භාවිතා කළ හැකි වීම

පහසුවෙන් කපු වගා කළ හැකි වීම

(b) අධික උෂ්ණත්වය යටතේ ඊට හිතකර වීම

අඩු මිලට ලබා ගත හැකි වීම (ලකුණු 3)

(iii) පරිසර දූෂණය සිදු වීම (ජලය, වාතය ගොඩබිම)

උෂ්ණත්වය ඉහළ යාම, අම්ල වැසි ඇතිවීම

කාර්මික අපද්‍රව්‍ය මුදාහැරීම. (ලකුණු 5)

(07) (i) B - යාබද කලාපය C - අනන්‍ය ආර්ථික කලාපය (ලකුණු 2)

(ii) (a) රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශය

(b) ගුවන, මුහුද, දූපත්, බොකු, තුඩු, කොරල් පර, වැලි, ගල් පස ආදිය (ලකුණු 3)

(iii) (a) ඉන්දියාව හා ලංකාව අතර බෙදා වෙන්කර ගත් ජල ප්‍රදේශයකි. (ලකුණු 2)

(b) ධීවර කර්මාන්තය, සංචාරක කර්මාන්තය, සෞන්දර්යාත්මක බව, දිවයිනට ආරක්ෂාව සැපයීම, දේශගුණික හිතකරතාවයට

(ලකුණු 5)

(08) (i) වේවැල් භාණ්ඩ, බීරළු, මැටි භාණ්ඩ, පිත්තල කැටයම්, ලී කැටයම් (ලකුණු 2)

(ii) සුළු ආයෝජනයක් සහිත වීම, කුඩා පරිමාණයෙන් වීම, පවුලේ ශ්‍රමය, නිවස හා වටපිටාව ස්ථානය වීම, සම්ප්‍රදායික ශිල්ප ක්‍රම භාවිතය, සරල යන්ත්‍ර භාවිතය (ලකුණු 3)

(iii) (a) කර්මාන්ත ගම්මාන ඇති කිරීම, දිවිනැගුම වැඩසටහන, ශ්‍රමිකයන් පුහුණු කිරීම, ප්‍රදර්ශන පැවැත්වීම

(b) අමුද්‍රව්‍ය ලබා ගැනීමේ ගැටළුව, නිෂ්පාදන වියදම ඉහළ යාම, අලෙවි කිරීමේ ගැටළුව, ආදේශන භාණ්ඩවලින් ඇති තරගය, පුහුණු ශ්‍රම හිඟය

(ලකුණු 5)